කොළඹ විශ්වවිද්‍යාලය
ශාස්ත්‍ර පීඨය
ශාස්ත්‍රවේදී ප්‍රථම වසර උපාධි පරීක්ෂණය
ප්‍රථම සෙමෙස්තරය - 2017/2018

# CMS 1101 – සන්නිවේදන ප්‍රවේශය

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න. කාලය පැය 02 යි.

01. 'සන්නිවේදනය යනු පොදු අවබෝධයක් තහවුරු කිරීමයි.' සන්නිවේදනය පිළිබඳ ඔබට අභිමත නිර්වචන ඇසුරින් සාකච්ඡා කරන්න.

02. මානව භාෂාවෙහි සුවිශිෂ්ටතාව හා අසීමිත ප්‍රබලතාව එහි ස්වලක්ෂණ පාදක කොටගෙන විමර්ශනය කරන්න.

03. 'හුදු විඥාපනය (Information) ඉක්මවා ගිය කාර්ය සම්භාරයක් නවීන සමාජයෙහි සන්නිවේදනය මගින් අපේක්ෂා කරනු ලැබේ.' විවරණය කරන්න.

04. විවිධ සන්නිවේදන ප්‍රභේද හඳුන්වා දී ජනසන්නිවේදනයෙහි විශේෂත්වය එහි ස්වලක්ෂණ කෙරෙහි සාවධාන ව විස්තර කරන්න.

05. 'රේඛීය සන්නිවේදන ආකෘතිවලට වඩා චක්‍රීය සන්නිවේදන ආකෘති සන්නිවේදන ක්‍රියාදාමය වටහාගැනීම සඳහා උපයෝගි කරගත හැකි ය'. ඔබට අභිමත රේඛීය සන්නිවේදන ආකෘතියක් හා චක්‍රීය සන්නිවේදන ආකෘතියක් සංසන්දනය කරමින් සාකච්ඡා කරන්න.

06. අන්තර්ජාතික සන්නිවේදනය හඳුන්වා දී වර්තමානයේ සන්නිවේදනය ගෝලීය ව ක්‍රියාත්මක වන ආකාරය උදාහරණ සහිත ව විග්‍රහ කරන්න.

07. පහත සඳහන් මාතෘකා අතරින් හතරක් (04) තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

අ. ඇරිස්ටෝටල් සන්නිවේදන ආකෘතිය

ආ. සංජානන මාන

ඇ. විල්බර් ශ්‍රාම්

ඈ. ද්විත්වතාව

ඉ. සත්ව සන්නිවේදනය

ඊ. දේහ භාෂාව